# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 994 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 13/06/2024 පැය 0955

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01.** **2024.06.12 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 33 | 720 | යකඩ බැරල් 04<br>ප්ලාස්ටික් බැරල් 07 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02.** **කුෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.06.12 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කඩවත පොලිස් වසමේ සූරියපාළුව ප්‍රදේශයේදී කුෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 601 ක්, ජංගම දුරකථන 01 ක් හා මත්ද්‍රව්‍ය අළෙවියෙන් උපයාගන්නා ලද බවට සැක සිතිය හැකි මුදල් රුපියල් 313,000/= ක් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට ගෙන කඩවත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වූ සූරියපාළුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කඩවත පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුර.

2024.06.12 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කළුතර දකුණ පොලිස් වසමේ හොලික්‍රොස් වටරවුම අසල ප්‍රදේශයේදී අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 103 මිලිග්‍රෑම් 172 ක්, කඩු 01 ක්, ජංගම දුරකථන 02 ක්, සිම්පත් 04 ක් හා ත්‍රීරෝද රථයක් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට ගෙන කළුතර දකුණ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25 හා 41 වයස් වල පසු වන කළුතර දකුණ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** කළුතර දකුණ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 04. නීති විරෝධීව ගංජා හේනක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.

2024.06.12 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් තණමල්විල පොලිස් වසමේ කහකුරුල්ලන්පැලැස්ස ප්‍රදේශයේදී නීති විරෝධීව වගාකර තිබූ ගංජා ගස් 9140 ක් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට ගෙන තණමල්විල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වූ තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අම්බලන්තොට කඳවුර.

2024.06.12 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අම්බලන්තොට කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පනාමුර පොලිස් වසමේ ඕමල්පේ ප්‍රදේශයේදී මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පනාමුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වූ ඕමල්පේ 1 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පනාමුර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 06. නීතිවිරෝධී දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුර.

2024.06.12 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කිලිනොච්චිය පොලිස් වසමේ අරිවියල් නගර් දුම්රිය ස්ථානය අසලදී නීති විරෝධී දුම්වැටි 300 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කිලිනොච්චිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 65 ක් වූ ඉහළ කිලිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**